
# බිංදුට හොඳ පාඩමක්



රිසින්දි සහන්සා අබේරත්න

# බිංදුට හොඳ පාඩමක්


## රිසින්දි සහන්සා අබේරත්න

කතෘ



## පළමු දිග හැරීම



මහාමායා බාලිකා විදුහල

2 - E ශ්‍රේණිය



2025.01.29

# පිදුම

**මගේ ආදර අම්මාට**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන

# කෘතියේ ආරම්භය



එකෝමත් එක ගමක අම්මයි තාත්තයි එක්ක ජීවත් වන පුංචි පවුලක් තිබුනා ඒ පවුලේ බිංදු කියලා චූටි ළමයෙක් හිටියා එයා හරිම දඟකාරයි වගේම හොඳ ගති ගුණ තියෙන ළමයෙක් ඉතින් මේ පුංචි බිංදු අම්මයි තාත්තයි සමඟ ගොඩක් සතුටින් ආදරයෙන් කාලය ගත කළා.



ඔන්න ඔහොම ඉන්න කොට දවසක් බිංදු එළියේ සෙල්ලම් කර කර ඉන්න වේලාවේ බිංදුට කුරුළුපැටවකුගේ කීච් බීච් කියන මිහිරි ශබ්දයක් ඇහුනා. බිංදු දුවගෙන දුවගෙන එතනට ගියා.

ඇහුණේ අඹ ගහේ තිබුන කුරුලු කූඩුවෙන් එදෙස බැලු බිංදු ගලක් ගෙන දමා ගැහුවා.

එතකොටම කුරුලු කූඩුවේ හිටපු කුරුලු පැටියා බිමට වැටුනා. බිංදු එතනට දුව ගොස් බිමට වැටුන කුරුලු පැටියා අතට ගත්තා.



බිංදු පැටියව අතට අරගෙන ගෙදරට ගිහිම් අම්මටත් පෙන්නලා බිංදු කුරුලු පැටියාව ආදරයෙන් අත ගගා සිටියා.

ඉන් ටික වෙලාවකට පස්සේ ජනේලය ගාවින් කුරුල්ලන් කෑගසන ශබ්දයක් ඇහුනා. එතකොටම බිංදු ජනේලය ඇරලා බැලුවා.

කුරුලු පැටියගෙ අම්මා දුකෙන් කලබලෙන් පැටියව හොයනවා දැක්කාද ඒ වේලාවෙ බිංදුට හිතුනා මාව නැති වුනොත් මගේ අම්මා කොච්චර දුක් වෙයි ද කියලා. එහෙම හිතුන බිංදු කුරුලු පැටියා. කුරුලු කූඩුවෙන්ම තිබ්බා. ඒක නිසා බිංදු හරිම සතුටින් ගෙදර ගියා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

# රිසින්දි සහන්සා අබේරත්න

**කතෘ**